M13/1/AXSIN/SP1/SIN/TZ0/XX

22130179

International Baccalaureate®
Baccalauréat International
Bachillerato Internacional

**SINHALESE A: LITERATURE – STANDARD LEVEL – PAPER 1**
**SINGHALAIS A : LITTÉRATURE – NIVEAU MOYEN – ÉPREUVE 1**
**SINGALÉS A: LITERATURA – NIVEL MEDIO – PRUEBA 1**

Wednesday 8 May 2013 (morning)
Mercredi 8 mai 2013 (matin)
Miercoles 8 de mayo de 2013 (mañana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Write a guided literary analysis on one passage only. In your answer you must address both of the guiding questions provided.
- The maximum mark for this examination paper is *[20 marks]*.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- N'ouvrez pas cette épreuve avant d'y être autorisé(e).
- Rédigez une analyse littéraire dirigée d'un seul des passages. Les deux questions d'orientation fournies doivent être traitées dans votre réponse.
- Le nombre maximum de points pour cette épreuve d'examen est *[20 points]*.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Escriba un análisis literario guiado sobre un solo pasaje. Debe abordar las dos preguntas de orientación en su respuesta.
- La puntuación máxima para esta prueba de examen es *[20 puntos]*.

2213-0179

© International Baccalaureate Organization 2013

**මෙම ඡේද අතුරෙන් එකක් සඳහා සාහිත්‍යමය විවරණයක් සපයන්න. පහත දක්වා ඇති උපකාරක ප්‍රශ්න දෙකට පිලිතුරු ඇතුළත් වන සේ විවරණය ඉදිරිපත් කළ යුතුයි.**

**1.**

"කලකට පසුව හමු වූ මිතුරියෝ ඉපිළ ගිය සතුටින් යුතුව කථා සල්ලාපයෙහි යෙදුණාහ. ඔවුහු අතීතය ආවර්ජනය කළහ. පාසල, සරසවිය ඔවුන් එකට ගමන් කළ මං පෙත්ය. ඒ ඔස්සේ මතකය අලුත් කරමින් ඔවුහු යළිත් පිය සටහන් තැබූහ. සවස තේ පානයෙන් පසු ප්‍රියා කුමාරිගෙන් සමු ගත් විට කුමාරි ඇය සමඟ ගේට්ටුව තෙක්ම ගමන් කළා ය. ගේට්ටුව අසල දී ප්‍රියා මොහොතක් නතරව වටපිට බැලුවාය. ඇය කුමාරිගේ මුහුණ එක එල්ලේ නොබලා ඈහට පතට නොදැනෙන සේ ආරංචියක් කීවාය.

"දැන් අතුල ඉන්නෙ අපේ පැත්තේ"

"අතුල" යන නම කණ වැකෙත්ම කුමාරිගේ හදවත කිඳා බැස්සා සේ දැනිණ. මෙතෙක් වූ සතුට මොහොතකට තුරල්ව ගියේය. ඇගේ මුහුණ වෙනස් වුයේය. ඇය ඇතුලත ඇති වූ වෙනස පිටතට නොපෙන්වා කථා කිරීමට උත්සාහ කළා ය.

"මං හිතුව එයා තාම රට කියල"

"රට ඉඳල ඇවිල්ල තියෙන්නෙ ගිය අවුරුද්දෙ"

"මං එයාගෙ පුතාට සිංහල උගන්වනව. පුතා මේ අවුරුද්දේ විභාගෙ කරන නිසා සිංහල උගන්වන්නය කියල අතුල වඳ කළා. මං කැමති වුනේ ඉස්සර කාලෙ ගැන හිතල." ප්‍රියා හොරැහින් කුමාරි දෙස බලා සිනාසුණාය.

"හැබෑට?" කුමාරි ද විහිලුව ගෙන සිනාසුණාය.

"අඟහරුවාදටයි, සෙනසුරාදටයි පුතාව එක්ක එන්න, යන්න, අතුලත් අපේ පැත්තෙ එනව." ප්‍රියා සිනාසෙමින් කියා කුමාරිගෙන් සමුගෙන සිය නිවස දෙසට පියමැන්නාය. මහ මග ඔස්සේ ප්‍රියා තමාගෙන් ඉවත්ව යනු කුමාරි බොහෝ වේලා බලා සිටියාය. ප්‍රියාගේ සේයාව කළු තිතක් වී අවසානයේ නොපෙනී ගියත් කුමාරි තමා සිටි ඉරියව්වේම පසු වූවාය. ඇගේ සිත සෙමින් සෙමින් අතීතයට ගමන් කළේය. සරසවිය හා අතුල පිළිබඳ මතකය කෙමෙන් පණ ගැන්විණ. කලක් තිස්සේ අබලන්ව ගිය, පණ නොනංවන ලද හෝරා යතුරක් යළිත් පණ ගන්වන ලද කලක සේ අතුල පිළිබඳ මතකය යළිත් ඇගේ හදේත් සිතේත් පණ ගන්වමින් ස්පන්දනය වූයේය. ඇය සිතින් පේරාදෙණිය සරසවියට පියවර මැන්නාය. කලාගාරය අසල තල් ගස් සෙවණේ නුවර බලා යන බසයක් එනතුරු තනිවම පසු වූ අතුලගේ රුව ඇගේ සිතේ පැහැදිලිව සිත්තම් වී ඇත. උස සිහින් සිරුර, බොකුටු කෙස්, දිගටි හැඩයෙන් යුත් මුහුණ, හැහිමි බර ලොකු ඇස්, දඟකාර සිනහව ගැන සිතත්ම ඇගේ හදවත ස්පන්දනය වන වේගය ද වැඩි විය.

අතුල තමා හා මුල් වරට සිනහ වූයේ එදින බව ඇය මෙනෙහි කළාය. පසුව පුස්තකාලය, කලාගාරය හා සරසවි ආපන ශාලාව ආදී ස්ථානයන්හි ඔහු දැකගන්ට ලැබුණි. ඔහු තමා හා මුල්වරට කථා කළ අවස්ථාව ඇය මෙනෙහි කළාය. එදින ඔහුගේ නෙත හා ඇගේ නෙත ගැටිණ. ලොකු රවුම් වූ ඔහුගේ දෑස් ඇය මෝහනයට පත් කළේ ඒ අවස්ථාවේදීය. ඈත භවයක තමා ඔහු හා පෙමින් වෙලී සිටින්ට ඇතැයි ඇයට සිතිණ. තවමත් ඇය තුළ ඒ දෑස දෑකගැනීමේ ආශාව නලියයි. සාමාන්‍යයෙන් දොඩමලු වන ඇය අතුල ඉදිරියේ ගොලු වූ අවස්ථා සිහිපත් කරත්ම කුමාරිට සිනහ පහළ විය. ඔහු ඉදිරියේ දිව පැටලුණ අවස්ථා එමටය.

**හිරිමල් වයසේ ආදරය පිළිබඳ නැවුම් හැඟුම් තමා තුළ ඇති වූයේ අතුල නිසා යයි ඇයට සිතිණ. වසන්තයේ පිපෙන මලක් සෙයින් තම ආදර කුසුම විකසිත වූයේ ඔහු නිසාය. තමාත් ඔහුත් එකිනෙකා හා පෙමින් වෙලී සිටි අයුරු ඇය සිහිපත් කළාය. තම ජීවිතයේ ආදර ගීතය ගයන්නට හදවත නමැති වීණාවේ තත් හැඬවූයේ අතුල යයි කුමාරිට සිතිණ. අතුලත් තමාත් ආදරයෙන් බැඳී සිටියද නොසිතූ විරූ ලෙස ඔවුනොවුන් වෙන් වූ අයුරු සිහිපත් කිරීමට කුමාරි අකමැති වූවාය. ඇගේ හදට ආදරයේ මිහිරත්, වෙන් වීමේ වේදනාවත් පළමු වරට විඳීමට ලැබුණේ අතුල නිසාය."**

**අජන්තා රාජපක්ෂ, මවට අහිමි පුතු** (1988)

(a) **මෙම කොටසෙන් නිරූපණය වන්නේ කෙබඳු අවස්ථාවක්ද?**

(b) **එම අවස්ථා නිරූපණය සඳහා කතුවරිය යොදාගෙන ඇති චිත්තරූප පිලිබඳව අදහස් දක්වන්න.**

**2.**

**අයියනායක**

සෙවනැලි අවදි නොමවන වැව් ඉවුරු කො ණේ
කාලය විසින් හෑරුව නුග ගසක බෙ ණේ
මළකා කළුව ගිය ආයුද කැබලි පෙ ණේ
දෙවියෙක් නැතද මෙහි බලයක් තිබෙනු දැ ණේ

බුද ගුරු ශනි හිරුට හිමි හැම දවස්ව ල
මේ සන්හිඳේ එලියක් ඇත සවස් ක ල
ලෙඩ දුක්වලින් මිදුමට බාරයක් ක ළ
හැම දෙන එතැන රැස්වෙති ගම ගෙවල්ව ල

වන පෙත දැවෙන විට වැද මළ හිරුගෙ ර ත
ගණඳුර වසන විට ආලෝකයෙහි නෙ ත
සඳ රැස් ගලන විට තෙරපී සෙවන ම ත
එක දෙවියෙක් නො වේ දාහක් එතන ඈ ත

දෙවි දේවතාවුන් සැරි සරන මහ ව ණේ
පවතින බලය ඇහ ලොම් තුඩකට ද දැ ණේ
මොලයෙන් තමා ලෝකයෙ සුවය වැනසු ණේ
මගෙ ගැරහුමට නැත ඒ පිරිස යොමු වු ණේ

සන්හිඳ ලඟ බාරයට කිරි ඉතිරි ම
කෙම්වර දවස්වල පානින් සැරසී ම
වන අතු කඩා ගස් දෙබලක දැවටී ම
මා නොකෙරුවත් නොකළෙමි එම ගැරහී ම

සාගත වසංගත හා එන නියඟ ව ලින්
සහනය පතා එන දෙවියන් ලඟට කෙ ලින්
එන මේ පිරිස සැරසීමට නුවණ ම ලින්
පෙළඹෙන අයට අනුකම්පා කරමි මු ලින්

ගංගොඩ වටා මෝරන වන ලැහැබ මැ න
අහුමුළු නෑර සිය අණසක පතුරු ව න
බලවත් අයියනායක, දෙන ගොදුරු ගෙ න
මේ අය රකිනු මැන යන එන සියලු තැ න

මාපිල් පිඹුරු නා පොළඟුන් සිටින තැ න
අලි කොටි වලස් මුළු කොලහල කරන තැ න
නිතරම ඔබ පුදන මේ අය ඇඳින ගෙ න
බලවත් දෙවි තුමනි දිව රෑ රකිනු මැ න

**විමලරත්න කුමාරගම, පද්‍යාවලි** (1952)

(a) මෙම කවි පන්තියෙන් නිරූපණය වන්නේ කෙබඳු පරිසරයක්ද?

(b) "ජන ඇදහිලි විශ්වාස ගැමි ජීවිතයේ පොදු ලක්ෂණයකි." එබඳු ඇදහිලි විශ්වාස පිලිබඳව මෙම කතුවරයාගේ ආකල්පය පැහැදිලි කරන්න.